" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary }
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / பொதுத் தொலைபேசி / General Telephone } 011 - 2093000

ISO 9001 · SLAB ACCREDITED · ISO/IEC: 17021 QMS-001-01

(123)

මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/ADM/18-38/FI/01-2022 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. } දිනය / திகதி / Date } 2022.06.22

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2022.06.21 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2022.06.15<br>රා.ප.චක්‍රලේඛ 15/2022 | රජයේ නිලධරයන්ට එක් දිනක් නිවසේ රැඳී සිට කෘෂිකාර්මික හා වගා කටයුතුවල යෙදීමට අවස්ථාව සලසා දීම. |
| 02 | 2022.06.17<br>රා.ප.චක්‍රලේඛ 16/2022 | රජයේ කාර්යාල වෙත නිලධරයන් කැඳවීම සීමා කිරීම. |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඩබ්.එම්.දයාවතී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 15/2022

මගේ අංකය : EST-6/03/LEA/1060
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2022.06. 15

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රජයේ නිලධරයන්ට එක් දිනක් නිවසේ රැඳී සිට කෘෂිකාර්මික හා වගා කටයුතුවල යෙදීමට අවස්ථාව සලසා දීම</u>**

රට තුළ දැනට පවතින ඉන්ධන සපයා ගැනීමේ සීමාවන් නිසා ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ මතුව ඇති ගැටලු හේතුවෙන් සාමාන්‍ය ජනතාවට, රාජ්‍ය නිලධරයන්ට මෙන්ම පෞද්ගලික අංශයේ නිලධරයන්ට ද පොදු ප්‍රවාහන සේවා භාවිත කිරීම මෙන්ම පෞද්ගලිකව ප්‍රවාහන පහසුකම් සපයා ගැනීම ද දුෂ්කරව ඇත. තව ද, ඉදිරි කාලයේ දී රට තුළ ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් ද ගැටලුකාරී තත්ත්වයක් උද්ගත විය හැකි බවට විවිධ පාර්ශ්ව වෙතින් කරුණු ඉදිරිපත්ව ඇත. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන මාස 03ක කාලයක් සඳහා සෑම සතියක ම සිකුරාදා දිනයේ නිවසේ රැඳී සිට තම ගෙවත්තේ ආහාර බෝග වගා කිරීමට රජයේ නිලධරයන්ට අවස්ථාව ලබා දීම සඳහා පහත විධිවිධානයන්ට යටත්ව සතියේ සිකුරාදා දිනය රජයේ කාර්යාල විවෘත නොකිරීමට 2022.06.13 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02. සිකුරාදා දිනයේ දී කාර්යාල වසා තැබීම සම්බන්ධයෙන් පහත විධිවිධාන අනුගමනය කරමින් කටයුතු කළ යුතු ය.

I. ජලය, විදුලිය, සෞඛ්‍ය, ආරක්ෂක සේවා, අධ්‍යාපන, ප්‍රවාහන, වරාය සහ ගුවන්තොටුපොළ ආදී අත්‍යවශ්‍ය සේවා සපයනු ලබන ආයතන සඳහා මෙන් ම අමාත්‍යාංශ ලේකම්වරයෙකු විසින් සිකුරාදා දිනයේ දී විවෘතව තැබිය යුතු බවට තීරණය කරනු ලබන ආයතන සඳහා ද මෙම චක්‍රලේඛ විධිවිධාන අදාළ කර නොගැනීම. එම ආයතන මෙම දිනය සාමාන්‍ය රාජකාරී දිනයක් සේ සලකා කටයුතු කිරීම.

II. 2022.05.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2022 නිකුත් වීමට පෙර සිට සේවා මුර ක්‍රමය යටතේ නිලධරයන් සේවයේ යොදවනු ලැබූ රාජ්‍ය ආයතන සඳහා මෙම චක්‍රලේඛ විධිවිධාන අදාළ කර නොගැනීම.

III. මෙලෙස කාර්යාලය වසා තබන දිනය තුළ දී නිලධරයන් ගෙවතු වගා හෝ කෙටිකාලීන ආහාර බෝග නිෂ්පාදනයට යෙදෙන ලෙස දිරිමත් කිරීම සහ එම වසම තුළ සිටින කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර නිලධාරීන් හෝ ආර්ථික සංවර්ධන නිලධාරීන් මඟින් එම කාර්යය අධීක්ෂණය කිරීමට වැඩපිළිවෙලක් ඒ සම්බන්ධයෙන් වගකිවයුතු ආයතන විසින් සකස් කිරීම.

IV. අදාළ ආයතනවල නිලධරයන් දැනටමත් නිවසේ සිට වැඩ කිරීම(Work from Home) සඳහා ක්‍රමවේදයක් යොදාගෙන තිබේ නම් මෙම දිනය තුළ අදාළ රාජකාරී ඒ අයුරින්ම ඉටු කිරීම.

V. මෙලෙස වසා තැබෙන දිනය තුළ හැකි තරම් ආයතනවලට නිලධරයන් කැඳවීම නැවැත්වීම හා ඒ හරහා රාජ්‍ය අංශයේ ජලය, විදුලිය සහ අනෙකුත් ආශ්‍රිත වියදම් පිරිවැය අඩුවන ලෙස කටයුතු කිරීම.

VI. සිකුරාදා දිනයේ වසා තබනු ලබන කාර්යාලවල නිලධරයන් එසේ වසා තැබූ සිකුරාදා දිනයේ දී හෝ ඉන්පසුව වහාම එළඹෙන සෙනසුරාදා හෝ ඉරිදා හෝ යන දිනවල දී අතිකාල පදනමින් හෝ නිවාඩු දින වැටුප් ගෙවීමේ පදනමින් හෝ සේවයේ නොයෙදවීම. තව ද නිවසේ සිට වැඩ කිරීමට යොදවා ඇති නිලධරයන් අතිකාල පදනමින් හෝ නිවාඩු දින වැටුප් ගෙවීමේ පදනමින් සෙනසුරාදා, ඉරිදා හෝ නිවාඩු දිනවල සේවයේ නොයෙදවිය යුතු ය.

VII. මෙම චක්‍රලේඛයේ විධිවිධාන රාජ්‍ය ව්‍යවසායන් සඳහා අදාළ කර ගැනීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් විමසා එකී උපදෙස් පරිදි කටයුතු කිරීම.

VIII. සතියේ වැඩකරන දින 5 තුළට සිකුරාදා දිනය නොවන රජයේ නිවාඩු දිනයක් හෝ දින කිහිපයක් හෝ යෙදුණහොත් එම සතියේ සිකුරාදා දිනය සාමාන්‍ය වැඩකරන දිනයක් ලෙස සලකා කාර්යාල විවෘත කිරීම.

03. අධිකරණ ක්ෂේත්‍රයට අයත් ආයතන සඳහා මෙම අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ඇත.

04. මෙම චක්‍රලේඛ විධිවිධාන 2022.06.24 දින සිට ක්‍රියාත්මක වන අතර "පවතින සම්පත් හිඟය මත රාජ්‍ය වියදම අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල කැඳවීම සීමා කිරීම" මැයෙන් නිකුත් කළ 2022.05.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2022 වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කෙරේ.

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය